සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

# වර්ෂ අවසාන ඇගයීම
# ஆண்டிறுதி மதிப்பீடு - 2017
# Year End Evaluation

| ශ්‍රේණිය / தரம் / Grade | 10 | විෂයය / பாடம் / Subject | සිංහල භාෂාව හා සාහිත්‍යය | පත්‍රය / வினாத்தாள் / Paper | II | කාලය / காலம் / Time | පැය 02 |
|---|---|---|---|---|---|---|---|

**සැලකිය යුතුයි:**

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80කි.

(01) අංක (i) සිට (x) දක්වා ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ පිළිතුරු නො ලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) (අ) හ්‍රස්ව ස්වරයක්
(ආ) ගුරු ස්වරයක් ලියන්න.

(ii) පහත දැක්වෙන වචන යොදා අර්ථවත් වාක්‍යය බැගින් ලියන්න.
(අ) කරන (ආ) කරණ

(iii) පහත දැක්වෙන වචනවල ව්‍යඤ්ජන හා ස්වර වෙන්කර දක්වන්න.
(අ) ශිෂ්‍ය (ආ) මනඃකල්පිත

(iv) පහත දැක්වෙන නාම පදවල ප්‍රකෘතිය හා ප්‍රත්‍ය වෙන් කොට ලියන්න.
(අ) සුහදත්ව (ආ) ප්‍රබලතා

(v) “නුවර විනිශ්චය ශාලාව පසුපසින් හේවායන් විසින් ළදරු මයිකල් ගෙන යනු ලබයි.”
ඉහත ප්‍රකාශයෙහි ඇතුළත්
(අ) නිපාත පදයක්
(ආ) උපසර්ග පදයක් ලියන්න.

(vi) පහත සඳහන් වචන ශ්‍රී සුමංගල ශබ්දකෝෂයෙන් උපුටා ගැනීමකි. එහි අරුත් ලියන්න.
(අ) කලරැවු (ආ) කලකල

(vii) පහත දැක්වෙන සන්ධි පද විසන්ධි කරන්න.
(අ) ප්‍රස්තාවෝචිත (ආ) ඉනික්බිති

(viii) පැතිර උදය ගිරි සිරසින් දිලි නොහැර
මිතුර බලාලව එන සඳ රැස් වතුර
ඉහත පද්‍ය පාදයෙහි ඇතුළත්
(අ) විධි ක්‍රියා පදයක්
(ආ) රූපකාර්ථයක් ලියන්න.



Department of Education – Western Province

(ix) පහත දැක්වෙන කියමන් සඳහා ගැළපෙන පිරුළු ලියන්න.

(අ) කලක් සතුරුව සිටි අය පවා පසුව මිතුරන් වන බව

(ආ) අය මාර්ග මුලුමනින් ම විනාශ කිරීම

(x) පහත දක්වෙන ප්‍රකාශ සඳහා තනි පද ලියන්න.

(අ) මැනවින් පුරුදු පුහුණු වූ

(ආ) ජනයා ඇද බැඳ ගන්නා (ලකුණු 2 × 10 = 20)

(02) පහත දැක්වෙන (අ) , (ආ), (ඉ), (ඊ) යන විස්තර අතුරෙන් **එකක්** තෝරාගෙන වචන 250කට නො අඩු වන සේ රචනයක් ලියන්න. රචනය සඳහා සුදුසු මාතෘකාවක් ද යොදන්න.

(අ) ඉපැරණි මූලාශ්‍රවලට අනුව හදිසි ආපදා තත්වයන්ට අපේ පැරන්නෝ ද මුහුණ දුන්හ. ශබ්දකෝෂ නිර්වචනයන්ට අනුව හදිසි හෝ විශාල අවාසනාවන්ත ව්‍යසනයක් ආපදාවක් ලෙස හැඳින්විය හැකි ය. මේ ආකාරයේ හදිසි ආපදාවක් ඇතිවීම වැළැක්විය නොහැකි වුව ද ඒවා කළමනාකරණය කිරීම පිළිබඳව අප දැනුවත් ව සිටීමෙන් ආර්ථික හා සාමාජීය වාසි රැසක් අත්කරගත හැකි ය.

(ආ) මනුශ්‍ය සමාජයෙහි ප්‍රචණ්ඩත්වය සියලු සීමා බිඳගෙන ඉස්මතු වන්නට පටන්ගෙන ඇත. අප මේ වාසය කරන්නේ පෙර කිසි කලෙක නොවූ විරූ ලෙස විවිධ ස්වරූපවලින් ප්‍රභණ්ඩත්වය රජයන යුගයකයි. තමන්ගේ ම සහෝදර ජනතාව හා ස්වභාව ෂර්මයට එහෙිව කරන මෙවැනි ක්‍රියාවල තරම දකින විට තැතිගැන්මක් ඇති වේ. එබැවින් සාම අධ්‍යාපනය සඳහා නව ප්‍රවේශයක් පාසල් තුළින් ආරම්භ කළ යුතු යි.

(ඉ) ජනතාව අතර පෝෂණය වුණු ඔවුන්ගේ කඳුලත් සිනහවත් වේදනාවත් සුන්දර ආකෘතියකින් ඔවුන්ට හිමිකර දෙන ජනකවිය ඇතැම් ප්‍රබුද්ධ කවියේ පවා නැති රස ජනනයකිරීමේ ශක්‍යතාවක් හිමිකරගෙන ඇත. ඒ ඒ ජන කණ්ඩායම්වල බස්වහර පිළිබඳව දැන ගැනීමටත් පොදු ජනතාවගේ විවිධ ජීවන වෘත්තීන් පිළිබඳව ඉගියක් ලබාගැනීමටත් මේ කවි ප්‍රබල උපකරණයකි. එසේ ම සන්නිවේදනය පහසුකර ගැනීමට ද ජනකවි පිටිවහලක් වෙයි.

(ඊ) එදින පාසල් නිවාඩු දිනයකි. පසන් උදෙන්ම අවදි වී පාඩම් කිරීමට පටන් ගත්තේ ය. ටික වේලාවකින් ඔහු හමුවීමට ඔහුගේ මිතුරෙකු වූ නිමල් පැමිණියේ ය. "පන්තියේ මිතුරන් සමග අද සෙල්ලම් කරමු" යැයි නිමල් යෝජනා කළේ ය. නැවත ගෙදර පැමිණෙන විට සවස 5.00 ද පසු වී ගොසිනි. තමාගේ මුළු දිනය ම අසාර්ථක වූවා යැයි පසන්ට සිතුණි. (ලකුණු 25)

(03) පහත දක්වෙන ඡේදය වචන 40 - 45 අතර වන සේ සාරාශ කොට ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න.

ගීත කලාව මගින් මිනිසුන් අතර ඇතිවන සබඳතා සියුම් ලෙස විවරණය කොට දැක්විය හැකි ය. ශ්‍රී ලාංකකයන් වන අපට ද ගීත සාහිත්‍යයක් ඇත. එබැවින් යම්කිසි ජනතාවක් සතුව ගීත කලාවක් තිබීමෙන් ගම්‍යමාන වන මූලික කාරණා දෙකක් ඇත්තේ ය. ඉන් පළමුවැන්න එක් ඩනතාව ශිෂ්ට සම්පන්න සභ්‍ය ජනතාවක් බවයි. දෙවැන්න ඔවුන් සතුව ඉතාම ශ්‍රේෂ්ඨ සාහිත්‍යයක් පවත්නා බවයි. අපගේ ආදිම සිංහලයෝ සීගිරියේ සුසිනිඳු සුමට කැටපත් පවුර මත ස්වකීය අත්දැකීම් සටහන් කළෝ ය. මේ අතර විදග්ධ කවීන් මෙන් ම ජීවිත තක්සලාවෙන්



Department of Education – Western Province

බොහෝ දේ උගත් මනා සේ ගැමි වහර දත් ගැමි කවියෝ ද වූහ. සීගිරියේ ගීය හැඳිනගෙන එහි කාව්‍යමය සංකල්පයත් ගීත මාධූර්යකත් කිසියම් අපූර්ව සංගීතවේදියෙකු විසින් ප්‍රතිනිර්මාණය කිරීමෙන් කර්ණ රසායන ගීතාවලියකට වුව ද නැගිය හැකි ය. එවිට කැටපත් බවුර පාදක කොටගෙන අපගේ පැරණි සිංහල ගීයේ මහිමය හෙවත් ආශ්චර්යය කුමක්දැයි පසක් කරනන්ට අපට හැකිවනු නොඅනුමානයි. දැනටමත් ඒ කාර්යය සඳහා දායකකවූවත් දක්නට ලැබීම සතුටට කාරණයකි.

ඉකුත් දශක දෙක තුළ අපගේ සිංහල ගීතයෙහි ඇති වූ ප්‍රධානතම විපර්යාසය එය භාවපූර්ණ නිර්මාණයක් බවට පත්වීමයි. එයින් අදහස් කරන්නේ කාව්‍ය සංකල්පයක් ගීතයෙහි හරය හෙවත් ආත්මය බවට පත්වීමයි. එබැවින් අර්,කතන වචන සමුදාය වෙනුවට ආර්ථවත් කාව්‍ය සංකල්පයක් ගීතය තුළින් බිහිවිය. මේ නිසා නියත වශයෙන්ම අතිශය සුන්දර වූ ද සංයනා වූ ද සාහිත්‍ය නිර්මාණයක් බවට ගීත කලාව ව්‍යාප්ත විය. (ලකුණු 10)

(04) පහත දැක්වෙන පද්‍ය පන්තිය කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.(ලකුණු 10)

රජයේ ආදායම සහ වියදම අතර පරතරය අයවැය පරතරය ලෙස හැඳින්වේ. ආදායමට වඩා වියදම වැඩිවන විට අයවැය හිඟයක් ද ආදායම වියදමට වඩා වැඩිවන විට අයවැය අතිරික්තයක් ද ඇති බවයි. ලෝකයේ බොහෝ රටවල දියුණු නොදියුණු භේදයකින් තොරව අයවැය හිඟයක් දක්නට ලැබේ. රාජ්‍ය අයවැයක් සැකසීමේ දී රජයක් විසින් තම ආදායම් මට්ටමට සීමා නොවී රටෙ මහජන සුභසිද්ධිය ඉහළ නැංවීම සඳහා කළ යුතු පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම් ඇස්තමේන්තු කෙරේ. මෙහි දී රජයක් හුදෙක් ඊළඟ වර්ෂයට සීමා නොවී බොහෝ විට රාජ්‍ය අයවැය ප්‍රතිපත්ති සහ රජයේ සමාජයීය හා ආර්ථික කාර්යභාරය පිළිබඳ මැදිකාලීන ආර්ථික සැලසුමක් හෝ ප්‍රතිපත්තියක් මත පිහිටා කටයුතු කරයි. එසේම මැතිවරණයක් ආසන් වන විට හෝ මැතිවරණයක් ජයගත් විගස ප්‍රාග්ධන නොවන වියදම් වර්ධනය කොට කෙටිකාලීන මහජන සුබසිද්ධිය තුළින් ප්‍රශංසා ලැබීමට ද රජයෙන් කටයුතු කරයි. එසේම වියදම් වැඩිවන අවස්ථාවක ඊට අවශ්‍ය මුදල් සොයා ගැනීම සඳහා බදු සහ වෙනත් තම ආදායම් මූලාශ්‍රයක් ද රජයේආදායම් ඇස්තමෙන්තු කිරීමේ දී ඇතුළත් කෙරේ.

Department of Education - Western Province

(i) ඡේදයට අනුව අයවැය හිඟයක් යනු කුමක්දැයි අර්ථ දක්වන්න.

(ii) රාජ්‍ය අයවැය සැකකසීමේ දී සීමා නොවිය යුත්තේ කුමන කාරණයකට ද?

(iii) කෙටිකාලීන මහජන ප්‍රශංසා ලැබීමට රජයන් කටයුතු කරන්නේ කුමන අවස්ථාවල ද?

(iv) රජයකට බදු අයකිරීමට සිදුවන්නේ කුමක් නිසාද?

(v) ඡේදයේ සඳහන් පහත දැක්වෙන පද සඳහා විරුද්ධාර්ථ තුනක් බැගින් ලියන්න.

(අ) ආසන්න (ආ) හිඟ

(05) සිරිපුර මහා විද්‍යාලයේ 10 ශ්‍රේණියේ සිසුන් පිරිසක් විසින් ප්‍රදේශයේ පාසල් ශිෂ්‍යයන් තුළ පොත්කියවීමේ රුචිය වර්ධනය කිරීමේ අදහසින් "පොත් කියවීමේ කඳවුරක්" සංවිධානය කිරීමට අදහස් කැයි. උදෑසන 10.00 සිට පස්වරු 5.00 දක්වා දිවෙන මේ වඩසටහන මගින් තවත් ප්‍රයෝජන ලබාගැනීම සඳහා විද්වත් දේශනයක් ද ඇතුළත් කර ඇත. මෙහිදී පොත් කියවීම සඳහා මානසික ඒකාග්‍රතාවයත් ඇතිකර ගන්නේ කෙසේ ද? කියවීමේ විවිධ ශෛලීන් මොනවා ද? යන කරුනු ගන ද සාකච්ඡා වටයක් පැවැත්වේ. මේ පිළිබඳ ප්‍රදේශයේ පාසල් සිසුන් දැනුම්වත් කිරීම සඳහා අත් පත්‍රිකාවක් සකසන්න. ඔබ සාහිත්‍ය සංගමයේ ලේකම්වරයා යැයි සිතන්න.

නැතහොත්

නැතහොත්,

ආයුර්වේද දෙපාර්තමේන්තුව මගින් පාසල් යන වයසේ දරුවන්ගේ මන්ද පෝෂණය අවම කර ගැනීමේ අදහසින් දේශීය ධාන්‍යවලින් සහ ඖෂධීය ශාකලින් සැකසූ කොළකැද පැකට්ටුවක් වෙළඳපොළට හඳුන්වා දීමට අදහස් කරයි. පහසුවෙන් සහ කෙටි කාලයකින් පිළිවෙළ කරගත හැකි මෙ පානය සඳහා සේවාලාබීන්ගේ ආකර්ෂණය දිනා ගත යුතුව ඇත. ඒ සඳහා සුදුසු වෙළඳ සැන්වීමක්

(ලකුණු 15)

Department of Education – Western Province